## රජයේ නිවේදනයයි

### 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත
### 2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් මෙම නියමය මගින් පනවමි.

**උපලේඛනය**

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 1 | 07.01 | 0701.90 | අනෙකුත් - අර්තාපල් | කි. ග්‍රෑමයට රු. 60/- |
| 2 | 07.03 | 0703.10.20 | බොම්බයි ළූණු | කි. ග්‍රෑමයට රු. 30/- |

මෙම නියමය, 2024 ඔක්තෝබර් මස 03 වැනි දින සිට 2024 නොවැම්බර් මස 30 දින දක්වා වු කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, අනෙකුත් - අර්තාපල් (රේගු සංකේතාංක 0701.90) ආනයනය කිරීමට අදාළව 2024.01.07 දිනැති අංක 2365/84 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කළ නියමය සහ අංක 2360/52 දරන 2023.11.30 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් බී ළූණු (රේගු සංකේතාංක 0703.10.20) සඳහා පනවා ඇති නියමය, 2024 ඔක්තෝබර් මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

**අනුර කුමාර දිසානායක**
**මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය**

2024 ඔක්තෝබර් මස 02 වන දින
කොළඹ 01,
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ
සංචාරක අමාත්‍යාංශයේදීය.